# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.21 පැය 1250 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 797 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ සබඳතා පැවැත්වූ සැකකරුවන් දෙදෙනෙකු ව්‍යාජ අංක තහඩු සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.04.19 වන දින ගම්පහ පොලිස් වසමේ වතුමුල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත නිවසක් පරික්ෂා කර T-56 ගිනි අවි 02 ක්, එම පතොරම් 118 ක්, එම පතොරම් ගැබ් 03 ක්, වෑන් රථයක්, කාර් රථයක් හා ත්‍රීරෝද රථයක්ද සමඟ සැකකරුවන් හය දෙනෙකු සහ අපරාධයට සැකපිට තවත් සැකකරුවන් දෙදෙනෙකු වශයෙන් සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමශර්නය සඳහා කොළඹ අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් තිබුණි.

ඒ අනුව, මේ සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් ඉහත ත්‍රිරෝද රථය සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩිදුර විමශර්නයේදී ත්‍රිරෝද රථය අලුත්වැඩියා කිරීම සඳහා ලබාදී තිබූ සීදූව පොලිස් වසමේ 18 කණුව ප්‍රදේශයේ පිහිටි ගාරාජයක් පරීක්ෂා කර අනන්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි තවත් ත්‍රිරෝද රථයක් සමඟ ගරාජයේ හිමිකරු 2025.04.20 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 වන ලියනගේ මුල්ල, සීදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම ත්‍රීරෝද රථ දෙකම දැනට විදේශගතව සිටින පුද්ගලයෙකු විසින් අළුත්වැඩියා කිරීම සඳහා මෙම ගරාජයට භාර දී ඇත. ගාරජයේ තිබී සොයාගත් ත්‍රීරෝද හිමිකාරීත්වය සම්බන්ධයෙන් සොයා බැලීමේදී මෙම ත්‍රීරෝද රථය රාගම තේවත්ත අසලදී සොරකම් කර ඇති බවට අනාවරණය වී ඇත.

අත්අඩංගුවට ගන්නා ලද ජීව උණ්ඩ සැකකරුවන් වෙත ලබා දුන් බවට සැකකරන පුද්ගලයාගේ ගල්පොත්ත ප්‍රදේශයේ පිහිටි නිවස පරීක්ෂා කිරීමේදී එහි තිබී ව්‍යාජව සකස් කරන ලද වාහන අංක තහඩු 06ක් සහ එම අංක වලට අදාළ රක්ෂණ සහතික හා ආදායම් බලපත්‍ර සමඟ සැකකරු 2025.04.20 වන දින දහවල් කාලයේදී විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායම විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඔහු සන්තකයේ තිබී ජංගම දුරකථන 04 ක් හා මත්කරල් 05 ක් ද සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන ගල්පොත්ත, උඩුගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුවන් දෙදෙනා කොළඹ අපරාධ කොට්ඨාසය වෙත වැඩිදුර විමර්ශන සඳහා භාර දී ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**